

මාක්ස්, ලෙනින්වාදී අන්තයෙන්ද, ලිබරල්වාදී අන්තයෙන්ද මිදී, දම්පල් තුමන් ගත් හෙළ බොදු මගට පිවිසි ලොකුසතු හේවා මෙත්තානන්ද හෙවත් එල්.එච්. මෙත්තානන්ද මහාසයාණෝ 1956 පෙබරවාරි 4ඩා අනඳ විදුහලේදී එළිදැක්වූ බෞද්ධ කමිටු වාර්තාව සඳහා අප්‍රමාණ මෙහෙවරක් කළහ. එසේම, එහි අධ්‍යාපනය සම්බන්ධ කොටසෙහි රචකයාණෝද වෙති. සිංහල බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් මහත් මෙහෙවරක් ... ක්‍රිස්තියානි මූලධර්මවාදයට හා දෙමළ බෙදුම්වාදයට එරෙහිව පැහැදිලි හඬක් හා වැඩපිළිවෙලක් ගොඩනැගූ ජාතික වීරයෙකි.!

# මෙරට ඓතිහාසික ජාතිය සිංහල ජාතියයි

## 4



***පසුගිය සතියෙන් ඉතිරි..***

ඔහුට හදිස්සි උවමනාවක් නිසා ආණ්ඩුවේ ණය මණ්ඩලයට ඒ ඉඩම උගස් කරන්නට අවාසනාවකට මෙන් ආණ්ඩුවේ ණය මණ්ඩලයේ ලේකම් වශයෙන් සිටියේ රෝමානු කතෝලික සභාවේ ඉහළම පූජක පදවි දරන සහෝදරයන් තුන් දෙනෙක් ඇති තදම රෝමානු කතෝලිකයෙකි. මේ රෝමානු කතෝලික ලේකම්වරයා රෝමානු කතෝලික සභාව සමඟ කුමන්ත්‍රණ කොට නොයෙක් කපටි සුත්තර යොදා අයිතිකරු නොදැනුවත්වම රෝමානු කතෝලික බිෂොප්තුමාට සුළු මුදලකට ඒ වටිනා ඉඩම මිලට ගැනීමට ඉඩ සලසා දුණි. ඊට පසු ඒ පිළිබඳ ලියකියවිලි ද රහසින් විනාශ කරවා දමා ඇත. මේ අපරාධය හේතුකොට ගෙන ඒ ඉඩම අයිතිව සිටි බෞද්ධ පිංවතා අද දවසේ සහ මහ මඟ බැසයන අසරණ අඩියකට පත්ව සිටි. ඒ විපතින් ඔහු ගලවා ගැනීමට රජය ඉදිරිපත් විය යුතුය.

තව ද රජය අලුතෙන් පිහිටුවා ගෙන යන ගොවි ජනපද රෝමානු කතෝලික සභාව අතිශයින් ප්‍රිය කරයි. එකම කතෝලිකයෙක්වත් නැති 'පදවිය' නම් මහා ගොවි ජනපදය අසල ගැමියන් 300 ක් පමණ උරුම කියන, අද දක්වා ගැමියන් වැඳුම් පිදුම් කරන පැරණි විහාරයන් ද ඇති අක්කර 750 ක් විශාල ජාති භ්‍රෂ්ටයන් එකෙකු හෝ දෙන්නෙකු මගින් රහසේ ලබාගෙන කල්තියා දැවැන්ත පල්ලියක් තනන්ට දූන් කැලේ සුද්දකරගෙන යයි.

මෙසේ ලංකාවේ හැමතැනම අක්කර සිය දහස් ගණන් ඉඩකඩම් අයිතිකරගෙන තව තවත් රම්‍ය වූ ස්ථාන රෝමානු කතෝලික සභාව සොය සොයා යයි. ළඟ දී රජය විසින් වරායේ වැඩකරන නිලධාරින් පදිංචි කරවා ගැනීමට තට්ටු ගෙවල් සෑදීම පිණිස වෙන්කර තිබෙන වරාය ඉදිරිපිට රම්‍ය වූ විශාල ඉඩමක් කතෝලික බිෂොප්තුමාට ඕනෑවී ඒ ඉඩමේ තට්ටු ගෙවල් හදන්ට එපා ඒක මට ඕනෑ. ඒ ඉඩම වෙනුවට අලුත් මාවත පාරේ මට අයිති ඉඩමක් දෙන්න කියා රජයට හිතුවක්කාරකමක් කර තිබේ.

මේ අන්දමේ බෞද්ධයින් විදේශීන්ට පාවා දෙන්ට රෝමානු කතෝලික සභාව නොයෙක් උපක්‍රම යොදද්දී රජයේ පාලන බලය තව තවත් අල්ලා ගැනීමට කැතලික් ඇක්ෂන් නම් රහස් ව්‍යාපාරය තදින්ම ගෙනයයි. ඒ මගින් රජයේ සේවාවල ඇබෑර්තු සොයාගෙන ඒවා කතෝලිකයින් ගෙන් පිරවීමට ද ඉහළ තනතුරු හා වරප්‍රසාද කතෝලිකයන්ට ලබාදීමට ද රෝමානු කතෝලික සභාව ක්‍රියාකරයි. දැනට පොලීසිය, යුද්ධ හමුදාව, නාවුක හමුදාව යන ත්‍රිවිධ හමුදාවල ඉහළ තනතුරු බොහොමයක් කතෝලිකයන්ට හිමි වී තිබේ. එසේම රජයේ භාණ්ඩාගාරයේ ඉහළ තනතුරු ද ඔවුන්ට හිමි වී තිබේ. රජයේ සේවාවල ඉහළ තනතුරු රෝමානු කතෝලිකයන්ට හිමිවීමෙන් ජාතික ප්‍රශ්න නොපිටට පෙරළෙයි. ඇමති මණ්ඩලයේ ලියකියවිලි රාජ්‍ය භාෂාවෙන් සකස් කළ යුතු යයි කර තිබුණ නියෝගය කඩා කප්පල් වෙන අයුරින් භාණ්ඩාගාරයේ කතෝලික මහා ලේකම්තුමා ඒ ලියකියවිලි සමඟ ඉංග්‍රිසි පිටපත් යැවිය යුතු යයි කළ නියමය ටික කලකට මේවාය... ඉහළ තනතුරක් දරණ බෞද්ධ තරුණයෙකුට කතෝලික ස්ත්‍රියක් නිතර නිතර මුණගස්වා ඔවුන් දෙදෙනා විවාහවීමට උපක්‍රම යොදයි. ඔවුන්ගේ දරුවන්ද කතෝලික කරන කොන්දේසි පිටයි. මින් පසු බෞද්ධ තරුණයාගේ බුද්ධාගම ගැන හැඟිම නැතිවෙයි. කතෝලික පතිනයට නැමී යයි. මේ හැර රජයේ එක්තරා නිලධාරි පිරිසකට ලැබිය යුතු හිඟපඩි මුදල් ලැබුනේ ඔවුන් අතරේ සිටි කතෝලිකයන් විසින් ඔවුන්ගේ දේව මෑණියන්ට යාච්ඤා කිරිම නිසා යයිද, ඒ පඩි මුදලෙන් කොටසක් රාගම සාදන කතෝලික මහා පල්ලිය සඳහා දෙන ලෙස බෞද්ධයින්ගෙන් ඉල්ලා සිටි බව රහසක් නොවේ. මෙයත් කැතලික් ඇක්ෂන් ව්‍යාපරයේ කපටිකමකි.

තවද සිංහල පනත නීති ගතවූවායින් පසු එය රජයේ සේවාවල ක්‍රියාත්මක විම අවුල් කිරිමට කතෝලික සභාවේ බලවතුන් පිරිසක් බලපෑවේය. කතෝලික අධ්‍යාපන අධ්‍යක්ෂ හවුස් මහතා නිසා රජය විසින් පාසල්වල පිහිටෙව් දන්ත චිකිත්සාගාර හයෙන් එකක්වත් බෞද්ධ ළමයින් සියයට සීයක් පවා සිටි ඇතැම් රජයේ පාසල්වල මුල් ගුරුවරයා තවම කතෝලිකය.

රජයේ සියලුම කටයුතුවල දී කැතලික් ඇක්ෂන් නම් රහස් ව්‍යාපාරයේ මෙහෙයවීමෙන් කතෝලිකයන්ගේ ප්‍රමාණයට ලැබිය යුතු ගණනට වඩා වරප්‍රසාද ඔවුන් ලබාගනිති. නිදසුනක් මෙන්න. මෑත දී රජය විසින් බම්බලපිටියේ සාදා නිමකරන ලද තට්ටු ගෙවල් බෙදාදීමට යොදවා සිටින ප්‍රධාන නිලධාරින් කතෝලික වෙති. ඔවුන්ගෙන් එක් නිලධාරියකුගේ සහෝදරියක් වූ කතෝලික කන්‍යා සොහොයුරියකගේ මැදහත්වීම කරණකොට ගෙන ඒ තට්ටු ගෙවල් අසූ අටෙන් ''88'' කතෝලිකයන්ට පනස් හතක් ''57'' බෙදා දී තිබෙන අතර බෞද්ධයන්ට ලැබී තිබෙන්නේ එකොළහක් පමණි.

කැතලික් ඇක්ෂන් නම් කතෝලික රයස් ව්‍යාපරයෙන් කෙරෙන තවත් අකටයුතු නම් රහසේ සිංහල කතෝලික නිලධාරින් උසිගන්වන බව දූත් ප්‍රකටය. මෙයද කැතලික් ඇක්ෂන් ව්‍යාපාරයේ උගුලකි.

තවද වෙළහෙලදාම් වලින්ද, ඉඩකඩම් වලින්ද, අධ්‍යාපන, රෝහල් සමාජ සේවා යව කොන්ත්‍රාත් වලින්ද, මස්මරන්නන්ගේ දහයෙන් පංගු බද්දක් ද යන විවිධ ක්‍රමවලින් රජයට කිසියම් ආදයම් බද්දක් නොගෙවා මුදල් සම්භාරයක් හම්බකරන එකම පුද්දගයා රෝමානු කතෝලික බිෂොප්තුමාය. කතෝලික ලිපියකින් හෙළිවි තිබෙන පරිදි ඔහුගේ වාර්ෂික ආදායම රුපියල් පහළොස් කෝටියකට වැඩිය. පහුගිය ආණ්ඩුවට එය විශාල ආදායමෙන් බද්දක් අයකර ගැනිමට සුදානම් වුණේ වී නමුත් නව ආණ්ඩුවට එය තවම වුවමනා වි නැත. මේ විධියට රෝමානු කතෝලක සභාවේ ආදයම වර්ෂයක් පාසා වැඩිවි ගොස් තව අවුරුදු කීපයකින් ලංකාණ්ඩුවේ ආදායමෙන් හරි අඩක් පමණ වෙනවාට කිසිම සැකයක් නැත. එවිට ලංකාව පාලනය පිණිස ලංකාණ්ඩුවටද රෝමානු කතෝලික සභාවද තරඟ වෙනවා ඇත. ඒ තරඟයෙන් දිනන්නේ රෝමානු කතෝලික සභාවයි. ඒ මන්ද? ඔවුන්ට විදේශීන්ගේ අනුබලය හා ආධාර ලැබෙන හෙයිනි. දැනටම රෝමානු කතෝලික සභාවට ලැබී තිබෙන රාජ්‍ය සේවා බලය, ආර්ථික බලය, සමාජ බලය, තව තවත්ත වැඩි දියුණු වීමෙන් දකුණු වියට්නාමය මෙන් ලංකාව රෝමානු කතෝලික රටක් වීමට ඉඩ තිබේ. එම නිසා ලංකාව විදේශීන්ට පාවාදෙන්නට දඟලන, ජාතික ව්‍යාපාර භේද භින්න කරන්නට සැරසෙන රෝමානු කතෝලික සභාවට තව තවත් බෞද්ධ ගම්වල කතෝලික පල්ලිද, කතෝලික පාසල්ද තනන්නට ඉඩදිය යුතුද? මේවා දැන දැන පිටකොන්ද නැති, තම බලය පමණක් රැකගත්තොත් සේරම හරි කියා හිතන ඇතැම් දේශපාලකයන් කියනුයේ ඕවා ඔහොම තමා, ප්‍රජාතනතන්ත්‍රවාදය අනුව ඕවාට ඉඩදෙන්න ඕනෑ. මෙවැනි පාලකයෝ ප්‍රජාතන්ත්‍රවදෙයේ හය හතරවත් නොදනිති. මහජනයා අතර නොසන්සුන්කම් හා කලකෝලහල ඇතිකරගන්නාවූ, මහජනයාගෙන් කොටසක් විදේශිය බලපෑම් වලට ඇදෙන්නාවූ, හොරෙන් චරපුරුෂයන් පුරුදු පුහුණු කරන්නාවූ ව්‍යාපාර ප්‍රජාතන්ත්‍රවාදය අනුව යයි කියන්නේ මොන කටකින්ද? රෝමානු කතෝලික සභාවේ මෙවැනි ජාති විරෝධි වැඩ හොඳට අවබෝධ කරගත් ඉහත සඳහන් කල ඉන්දියා මාධ්‍ය ප්‍රදේශ ආණ්ඩුවේ වාර්තාවෙන් තීරණය කරගෙන තිබෙන්නේ ඒ සභාව මගින් කතෝලික නොවන උදවිය බෞතිස්ම කිරිම පවා රජයේ අවසරය ඇතිව පමණක් විය යුතු බවයි.

ඉන්දියා මධ්‍ය ප්‍රදේශ ආණ්ඩුවේ වාර්තාවෙන් රෝමානු කතෝලික ව්‍යාපාරය ගැන කදිම පාඩමක් අපේ අදූරදර්ශි පාලකයන්ට ඉගෙනගත හැක. ඒ වාර්තාවෙන් හෙළිකර තිබෙන කරුණක් කියමි. ඉන්දියාට නිදහස ලැබිගෙන එන හෙළිකර තිබෙන කරුණක් කියමි. ඉන්දියාවට නිදහස ලැබීගෙන එන අවධියේදී රෝමානු කතෝලිකයන් බහුලව සිටින ජාර්ඛණ්ඩ් නම් ප්‍රදේශයේ ජනතාව තමන් රෝමානු කතෝලික විමෙන් වෙනම ජාතියක් වී යයි උද්ඝෝෂණය කළෝය. එම නිසා බුරුමයේ ක්‍රිස්තු භක්තික කේරන්වරු බුරුමයෙන් වෙන්වුණා සේ ඒ කතෝලික ප්‍රදේශය ඉන්දියා රාජ්‍යයෙන් වෙන්වූ රටක් කළ යුතු යැයි ඉල්ලා සිටියහ. ඒ ඉල්ලාමට ඉංග්‍රිසීන්ද, ඇංග්ලෝ ඉන්දියන්වරු සහයෝගය දුන්හ. දැනට කතෝලික පූජකවරුන් යටතේ ඔවුන් ගෙනයන ව්‍යාපාරය නම් ජවහර්ලාල්ගේ රාජ්‍ය ඉක්මනින් අවසන් වෙයි. ක්‍රිස්තු රාජ්‍යයක් ඇතිවෙයි. හැම ඉන්දියන්කාරයාගේම නමස්කාරය වන ''ජයිහින්ඩ්'' වෙනුවට ඔවුන් ''ජය ක්‍රිස්තු'' කියා යොදාගන තිබේ. එසේම කතෝලිකයන් වෙසෙන පෙදෙස ''ස්වර්ගයේ ජනපදය'' ''ඝදකදබහ දශ යැඩැබ'' කියා හඳුන්වයි. එය ක්‍රිස්තුස් වහන්සේගේ අධිරාජ්‍යයට ''The Empire of Christ'' ඇඳිමට කතෝලික සභාව බලාපොරොත්තු වෙයි. මේ ප්‍රයෝග වලින් ඉන්දියාවේ එකී කතෝලික ප්‍රදේශය විදේශී ආණ්ඩුවේ බලකොටුවක් කර ඉන්දියා රාජ්‍ය පාලනය කඩා කප්පල් කරන්නට මහත් පරිශ්‍රම දරයි.

එවැන්නක් ලංකාවේද සිදුවන්නට බැරිද? රෝමානු කතෝලික සභාවේ රහස් වැඩ පිළිවෙල කෙසේද කිවහොත් බෞද්ධයාගේ ඡන්දය නිසා බලයට පත් නව ආණ්ඩුවට දූන් බෞද්ධයාට දුන් පොරොන්දු අමතක වී හැම අතින්ම කතෝලික සභාවේ සිත් ෂතුටු කිරිමට වෙහෙසෙන බව පෙනේ. ඊට නිදර්ශනයක් මෙයයි. එක පලාතක බෞද්ධ පාසල් වලට නොයෙක් අවහිරකම් කල කතෝලික පාඨශාලා පරීක්ෂකවරයෙක් වෙන පලාතකට අධ්‍යාපන දෙපාර්තුමෙන්තුව මාරු කළේය.

ලබන කලාපයට